ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

කළමනාකරණ අධ්‍යයනවේදී උපාධි පාඨමාලාව

5 වන මට්ටම - 2004/2005

අවසාන පරීක්ෂණය - 2006

**MCU 3206** - සංවිධානමය චර්යාව

කාලය පැය තුනයි.

---

දිනය 2006.02.11 වේලාව - ප.ව. 01.30 - ප.ව 04.30

---

උපදෙස් - ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න. සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු ඇත.

සියළුම පිළිතුරු, යෝග්‍ය ප්‍රවේශයක්, කරුණු සමූහයක් හා නිගමනයක් වන ලෙස ව්‍යුහගත කළ යුතුය.

සෑම නිදර්ශණයක්ම සත්‍ය වූවක් විය යුතුය. සංවිධානය ආදී අභව්‍ය වූ නිදර්ශණයන්ට ලකුණු නොලැබේ.

කියවීමට නොහැකි, නොපැහැදිලි, අවිනිශ්චිත හා අසම්පූර්ණ පිළිතරුවලට ලකුණු නොලැබේ.

01. කළමනාකරණ නොවන පසුබිමක් ඇති පුද්ගලයකු වන ඔබේ ප්‍රධාන විධායක නිලධාරියා, සංවිධානයෙහි හා කාර්යමණ්ඩලයෙහි කැපවීමේ ඌණතාවය සහ අකාර්යක්ෂමතාවය පිළිබඳව ඔබට පැමිණිලි කරයි. කළමනාකරණ ශිෂ්‍යයකු වශයෙන් ඔබ, ඔහුව එම තත්වය පිළිබඳව දැනුවත් කරන්නේ කෙසේ ද?

02. "සංවිධානමය චර්යාව යනු ඒ පිළිබඳවම වූ සුවිශේෂ විෂයයකි." ඔබ මේ ප්‍රකාශය හා එකඟ වන්නේ ද ? එකඟ නොවන්නේ ද? එසේ වන්නේ හෝ නොවන්නේ ඇයි ? පැහැදිලි කරන්න.

03. කළමනාකරුවකුට පුද්ගල චර්යාවය අවබෝධ කර ගත හැක්කේ කෙසේ ද?

එසේ අවබෝධ කර ගැනීමට ආධාර විය හැකි එකිනෙකට වෙනස් විධි පහක් පැහැදිලි කරන්න.

04. අභිප්‍රේරණය පිළිබඳ ක්‍රියාවලි න්‍යායක ප්‍රයෝජනවත් බව ඔබගේම සුදුසු උදාහරණයක් සමඟ පැහැදිලි කර විශ්ලේෂණය කරන්න.

05. පෞරුෂත්වය යන්නෙහි අර්ථය පැහැදිලි කරන්න. පුද්ගලයෙකුගේ පෞරුෂත්වය අවබෝධ කර ගත හැකි වෙනස් ක්‍රම දෙකක් යෝජනා කරන්න.

කළමනාකරුවකුට කුමන ආකාරයේ තීරණයන්හිදී එවැනි අවබෝධයකින් පහසුවක් සැලසේ ද ?

06. සංවිධාන චර්යාව පසුබිම තුළ ආතතිය යන්නෙහි අර්ථය ඔබේම වචනයෙන් පැහැදිලි කරන්න.

ආතතියෙහි, ප්‍රභවයන්, ප්‍රතිඵලයන් හා පාලනයෙහි උපාය මාර්ගයන් කෙටියෙන් සාකච්ඡා කරන්න.

07. "සංවිධානයක අධීක්ෂක තත්ත්වයක් දරණ ඕනෑම කෙනෙක් නායකයෙකි." මෙම අදහසට ඔබ එකඟවන්නේ ද? නැද්ද ? එසේ එකඟ වන්නේ හෝ නොවන්නේ ඇයි ? නිශ්චිත හේතු හා ඔබේම උදාහරණ දෙන්න.

- හිමිකම් ඇවිරිණි. -